# පුරාණ කල්තොට ගොවි ජනපදයට ආවේණික කණබැන්දුම් බැම්ම ශාන්තිකර්මය

**දිල්රුක්ෂි ඒ.ඩබ්.පී.එස්.**[1]

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වලව ගංගා නිම්නයේ පිහිටි ඓතිහාසික කල්තොට ගොවි ජනපදයට ම ආවේණික ශාන්තිකර්ම අතර කණබැන්දුම් බැම්ම බැඳීමේ ශාන්තිකර්මය විශේෂ වේ. මෙම අධ්‍යයනයේ ගැටලුව පුරාණ කල්තොට ගොවි ජනපදයට ආවේණික සංස්කෘතිකාංග අතර කණබැන්දුම් බැම්ම ශාන්තිකර්මයට හිමිවන ස්ථානය කෙබඳු ද යන්න හඳුනා ගැනීම යි. කණබැන්දුම් බැම්ම ශාන්තිකර්මය හා බැඳුණු ආගමික, සංස්කෘතික හා සමාජීය පසුබිම අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. දත්ත රැස්කිරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ආදී විධික්‍රම යොදා ගැණිනි. ඓතිහාසික කල්තොට ගොවි ජනපදය වලවේ ගං දිය ජල මූලාශ්‍රය කොටගෙන වගා කෙරෙන අතර මෙම වාරි ව්‍යාපෘතියේ ඉතිහාසය 1892 වසර දක්වා අතීතයකට යොමු වෙයි. වලවේ ගඟ තැනිතලා බිමක් ඔස්සේ ගලායාම ආරම්භ වන කල්තොට දී අමුණක් බැඳ ඉන් ලබාගන්නා ජලය මුල් කාලයේ දී කල්තොට අමුණේ සිට ගෝනකඳුර දක්වා වූ ඇළ මාර්ගයක් මඟින් කල්තොට පුරාණගම ගොවිබිම් අස්වැද්දීම සිදුකොට ඇත. කණබැන්දුම් බැම්ම බැඳීමේ ශාන්තිකර්මය ඇරඹෙන්නේ මේ හා සමගාමී ව ය. දැඩි නියං සමයන්හි දී ගඟේ ජල මට්ටම පහළ යන අතර අමුණ මඟින් ද ජලය ලබාගැනීමට නොහැකි අවස්ථාවන් උදා වනු ඇත. එවිට කල්තොට පුරාණගම ගොවියන් එක් ව කල්තොට අමුණ කරා ගොස් ගස්වල අතුඉති මඟින් අමුණ හරස්කොට කණබැන්දුම් බැම්ම බැඳ ගඟෙන් ස්නානය කොට බෙරවයමින්, නටමින්, අඩනිර්වස්ත්‍ර ව නොසරුප් වදනින් කෑගසමින් ශාන්තිකර්මය සිදුකරනු ලබයි. මේ සඳහා ගමේ වැඩිහිටි පිරිමි පුද්ගලයන් පමණක් සම්බන්ධ වන අතර ශාන්තිකර්මයෙන් අනතුරුව ගොවියන් නිවෙස්වලට පැමිණීමට මත්තෙන් මහ වැසි ඇඳහැලී කණබැන්දුම් බැම්ම කඩාගෙන ගඟ දෙගොඩතලා ගලායමින් ගොවිතැනට අවශ්‍ය ජලය ලැබීම සිදුවන බව ගොවියන්ගේ සත්‍ය වූ විශ්වාසය යි. වර්තමානයේ කල්තොට ගොවි ජනපදයේ ක්‍රියාත්මක ගොවි සංවිධාන හා ප්‍රදේශයේ විහාරස්ථානයන්හි මූලිකත්වයෙන් ශාන්තිකර්මය සිදුකරනු ලබන අතර දැඩි නියං සමයන්හී දී කල්තොට අමුණේ පෙර පරිදිම කණබැන්දුම් බැම්ම බැඳ සෙත්පිරිත් සජ්ඣායනා කොට එම පිරිත් පැන් ගොවි ජනපදය පුරා ඉසිමින් පැමිණෙන භික්ෂූන් වහන්සේලා විහාරස්ථානයන්ට වැඩම කිරීමට පෙර අතීතයේ සේ ම වැසි ඇදහැලී කණබැන්දුම් බැම්ම කඩායමින් ගඟ ගලායයි. ඒ අනුව පුරාණ කණබැන්දුම් බැම්ම ශාන්තිකර්මයේ සත්‍යයන් මතු පරපුර මත්තෙහිත් විශ්වාසයක් හා භක්තියක් ඇති කර ඇත. මෙම අධ්‍යයනයේ දී පෙනීයන්නේ පුරාණ කල්තොට නිම්නයට ආවේණික කණබැන්දුම් බැම්ම ශාන්තිකර්මය පුරාණයේ සිට නූතනය වන විට ආගමික තේමාවක් මූලික කරගෙන නව මුහුණුවරක් ගනිමින් එදා සිට අද දක්වා පවත්වාගෙන ඒමට කල්තොට ගොවි පරපුර කටයුතු ඇති බව යි.

**මුඛ්‍ය පද :** කණබැන්දුම් බැම්ම, කල්තොට අමුණ, වලව නිම්නය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. piyumisulakkhana98@gmail.com